NDB Elevate සේවාව - නියම සහ කොන්දේසි

1. NDB Elevate සේවාවේ සාමාජිකත්වය හිමි වන්නේ, බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන යෝග්‍යතා නිර්ණායක සපුරන ගනුදෙනුකරුවන්ට වේ.

2. NDB Elevate සේවාව යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ, වරප්‍රසාද, විශේෂාංග සහ සේවාවන්, බැංකුවේ පොදු නියම හා කොන්දේසිවලට සහ අදාළ නිෂ්පාදන සහ සේවා පාලනය කරනු ලබන යම් නිශ්චිත නියම සහ කොන්දේසිවලට යටත් වේ.

3. NDB Elevate සේවාවේ සාමාජිකත්වය සහ අදාළ ප්‍රතිලාභ අනුමත කිරීමේ, අනුමත නොකිරීමේ, තාවකාලිකව අත්හිටුවීමේ හෝ අවසන් කිරීමේ පරම අභිමතය බැංකුව සතු වේ.

4. ගනුදෙනුකරුවා විසින් අදාළ යෝග්‍යතා නිර්ණායක තවදුරටත් සපුරාලනු නොලබන්නේ නම් හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, NDB Elevate සේවාවේ ප්‍රතිලාභ, වරප්‍රසාද සහ අනුග්‍රහාත්මක වැඩපිළිවෙළ ප්‍රතිශෝධනය කිරීම, ඉවත් කිරීම හෝ අත්හිටුවීම සිදු කරනු ලැබිය හැකි ය.

5. අවශ්‍ය යයි සලකනු ලබන ආකාරයට සහ එම අවස්ථාවේ දී, යම් යෝග්‍යතා නිර්ණායක, ප්‍රතිලාභ, වරප්‍රසාද, විශේෂාංග සේවා හෝ මෙම නියම සහ කොන්දේසි සංශෝධනය කිරීමේ, ප්‍රතිශෝධනය කිරීමේ, වෙනස් කිරීමේ හෝ අත්හිටුවීමේ අයිතිය බැංකුව සතු වේ.

6. එවැනි යම් වෙනස්කම්, බැංකුවේවෙබ් අඩවිය,ශාඛා, ප්‍රකාශ, ඉලෙක්ට්‍රොනික නාලිකා හෝ බැංකුව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් යම් සන්නිවේදන ක්‍රමයක් මගින් සන්නිවේදනය කරනු ලැබිය හැකි ය.

7. ගනුදෙනුකරුවා විසින් ලබා ගන්නා ලද නිෂ්පාදන සහ සේවා සම්බන්ධයෙන් අදාළ වන ගාස්තු, අය කිරීම් සහ කොමිස් මුදල්, බැංකුවේ දැනට පවතින තීරු බදු සහ සේවා ගාස්තු අනුව අඛණ්ඩව අදාළ විය යුතු ය.

8. ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන අදාළ නීති, නියෝග හෝ විධාන මගින් යම් සංශෝධනය කිරීම්, නියම කරනු ලබන අවස්ථාවක දී මේ නියම සහ කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

9. නියම සහ කොන්දේසි පාලනය කිරීම සහ තේරුම් ගැනීම ශ්‍රී ලංකාවේ නීතිය මගින් සිදු කරනු ලැබිය යුතු ය.